සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020
Second Term Test - Grade 13 - 2020

විභාග අංකය ............................ නාට්‍ය හා රංගකලාව I කාලය පැය තුනයි

උපදෙස්

♦ I කොටස II කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
♦ II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. ආහාර්ය අභිනය හා සම්බන්ධ වන්නේ,
1. සියලුම සංවාද හා රංග විධාන කොටස් ය.
2. නළුවාගේ සියලු අංගචලනයන්ය.
3. ප්‍රේක්ෂක අපේක්ෂා මුදුන්පත්වීමය.
4. ආනුෂංගික සියලුම කලා අංගයන්
5. සාත්වික භාව ප්‍රකාශනයන් ය. (.........)

02. කලාව යන්න නිර්වචනය කිරීම අසීරු වන්නේ,
1. එය පුද්ගල බද්ධ බැවිනි.
2. විෂය ක්ෂේත්‍රය අසීමිත බැවිනි.
3. එහි විවිධ වර්ගීකරණය ඇති බැවිනි.
4. එය ස්වභාව ධර්මය හා සම්බන්ධ වන බැවිනි.
5. ප්‍රතිභාව මත පදනම් වන බැවිනි. (.........)

03. නෘත්‍ය යනුවෙන් හඳුන්වන්නේ,
1. රිද්මයක් අර්ථයක් මනෝභාවයක් සහිත නර්තනයකි.
2. ආංගික අභිනය මත සිදු කෙරෙන නර්තනයකි.
3. නාට්‍ය කලාවේ නොයෙදෙන්නකි.
4. ගායනට මූලිකත්වය ලැබෙන නර්තන ක්‍රමයකි.
5. නෘත්‍ය යන පදයට සමාන වන්නකි. (.........)

04. නාට්‍යයක ගැටුම යන්නෙන් හැඳින්වෙන්නේ,
1. නාට්‍ය නරඹන්නන්ගේ ප්‍රතිචාරයකි.
2. කතාව හා ක්‍රියාව අතර සිදුවන්නකි.
3. නාට්‍යයේ නළුවන් අතර ඇතිවන්නකි.
4. සිද්ධි හා අවස්ථා තර්කානුකූලව පෙළගැස්වීමකි.
5. ප්‍රේක්ෂකයා නාට්‍ය කෙරෙහි දැඩිව රඳවා ගැනීමට හේතු වන්නකි. (.........)

05. රූපණයෙහි සාර්ථකත්වයට අත්‍යාවශ්‍යයෙන්ම පුහුණු කළ යුත්තේ,
1. හඬ අභ්‍යාසය
2. සංවාද මතක තබා ගැනීම
3. ශිථිලකරණ සංවේදන, හඬ හා පරිකල්පන අභ්‍යාසය
4. සාත්වික අභිනය
5. ශිථිලකරණ අභ්‍යාස (.........)

- **අංක 6 සිට 10 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාල කරගන්න.**

| | | |
|---|---|---|
| A - මංගර දෙවි | B - ගිනි දෙවියන් පිදීම | C - ආවැන්දුම |
| D - දීපංකර | E - පුබ්බේරිය ගස | F - කණ සන්නිය |
| G - ගබඩා කොල්ලය | H - කිරිමඩුව | I - මන්ත්‍ර ජප කිරීම |
| J - නාමල් විල | k - නානුමුරය | L - හත්දා ගී මඩු |
| M - වැද්දන් ගිවිස්සීම | N - තරුණ කාන්තාව | O - පැපොල් පැලීම |

06. අභිචාරවිදීන් හා සම්බන්ධ වන්නේ,
1. C E හා M 2. B I හා O 3. F H හා J 4. A C හා D 5. K N හා O (.........)

07. උඩරට ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,
1. C K හා M 2. C G හා M 3. G J හා N 4. G J හා N 5. H J හා Z (.........)

08. සබරගමු ශාන්තිකර්ම හා සම්බන්ධ වන්නේ,
1. A D හා H 2. B D හා J 3. H K හා L 4. A H හා L 5. A D හා I (.........)

09. සන්නියකුම හා සම්බන්ධ වන්නේ,
1. E F හා N 2. A C හා H 3. K M හා N 4. E G හා O 5. F H හා L (.........)

10. රටයකුම හා සම්බන්ධ වන්නේ,
1. D J හා N 2. D E හා J 3. D J හා K 4. H K හා L 5. C H හා M (.........)

11. නාට්‍යධර්මී නාට්‍යයක ලක්ෂණයක් වන්නේ,
1. සතර අභිනය අවමවශයෙන් භාවිතා වීම.
2. වේදිකා සැරසිලි බහුල වීම.
3. ආත්ම භාෂණවලින් තොරවීම.
4. සංවාද එදිනෙදා ජීවිතයේ යෙදෙන ආකාරයට පමණක් භාවිතා කිරීම.
5. විවිධ විධි නියමයකට අනුව රංග පීඨය මත ඉදිරිපත් කෙරෙන කක්ෂය විභාගය (.........)

- **අංක 12 සිට 16 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාල කරගන්න.**

| | | |
|---|---|---|
| A - ත්‍රිපතාක | B - සන්දිම | C - බීජ |
| D - චූලිකා | E - නාටක | F - අංකවතාර |
| G - කර්තරිමුඛ | H - පතාකා | I - ව්‍යජීම |
| J - ඩිම | k - විෂ්කම්භක | L - වේෂ්ඨික |
| M - හංසාස්‍ය | N - ව්‍යායෝග | O - කාර්ය |

12. සංස්කෘත නාට්‍යයේ වේදිකා සැරසිලි වන්නේ, (පුස්ත)
1. C G හා M 2. A I හා K 3. B I හා L 4. A D හා O 5. J L හා N (.........)


13. සංස්කෘත අර්ථෝපක්ශේප වලට අදාල වන්නේ,
1. D F හා K 2. A G හා L 3. B G හා L 4. C H හා M 5. D I හා N (.........)

14. අර්ථ ප්‍රකෘති සඳහා අදාල වන්නේ,
1. A E හා F 2. C H හා O 3. F J හා K 4. G I හා M 5. K M හා O (.........)

15. හස්ත මුද්‍රා සඳහා අදාල වන්නේ,
1. B F හා K 2. C H හා L 3. D H හා M 4. A G හා M 5. G J හා O (.........)

16. දශරූපක වලට අදාල වන්නේ,
1. D I හා N 2. A H හා M 3. C H හා M 4. D L හා O 5. E J හා N (.........)

- **ප්‍රශ්න අංක 17 හා 18 සඳහා පිළිතුරු සැපයීමට පහත රූපසටහන අදාල කරගන්න.**




17. ඉහත රූපයේ A වලින් දැක්වෙන්නේ,
    1. මත්තවාරණී   2. රංගශීර්ෂය   3. නේපත්‍යාගාරය
    4. දොරටු   5. රංගපීඨය   (.........)

18. ඉහත රූපයේ B වලින් දැක්වෙන්නේ,
    1. මත්තවාරණී   2. රංගශීර්ෂය   3. නේපත්‍යාගාරය
    4. රංග ශීර්ෂය   5. දොරටු   (.........)

19. ස්වප්නවාසවදත්ත, චාරුදත්ත, ප්‍රතිඥායෞගන්ධරායන යන නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
    1. විශාක දත්ත   2. ශුද්‍රක   3. භාස   4. ශ්‍රිහර්ෂ   5. කලිදාස   (.........)

20. වික්‍රමෝර්වශිය හා මාලවිකාග්නි මිත්‍ර යන නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
    1. අභිනව ගුප්ත   2. ධනංජය   3. ශුද්‍රක   4. කාලිදාස   5. ශ්‍රීහර්ෂ   (.........)

- **21 සිට 25 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා අදාල නාම පහ බැගින් දී ඇත. එයින් නොගැලපෙන පදය බැගින් තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. 1. පරයා   2. වෙදරාල   3. සොකරි
    4. බහුභූතයා   5. ගුරුහාමි   (.........)

22. 1. රති   2. හාස   3. ඪිම
    4. ක්‍රෝධ   5. ජුගුප්සා   (.........)

23. 1. කුවේණි   2. පත්තිනි   3. දිවිදොස්
    4. කොහොඹා   5. රාහු අසුරේන්ද්‍ර   (.........)

24. 1. ආවැන්දුම   2. යක්ඇනුම   3. කෝල්පාඩුව
    4. දුනුමාලප්පුව   5. දොවොල් ගොඩබැසීම   (.........)

- **අංක 25 සිට 30 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාළ කර ගන්න.**

A - පිටිසර කෙල්ල   B - වෙස්සන්තර   C - අන්දරේලා
D - පෙරලෙන ඉරණම   E - මායාවති   F - වැරදුනු කුරුමානම
G - බූරුවා මහත්තයා   H - විධුර   I - නගරෙන් කෙතට
J - දියසේන   k - සීදේවි   L - සුද්දෙක් ඔබ අමතයි
M - කඩවුන පොරොන්දුව   N - මාලනී   O - සිරිසඟබෝ

25. නූර්ති නාට්‍ය ලෙස ප්‍රසිද්ධියට පත්වී ඇති.
    1. B H හා O   2. A F හා K   3. E I හා O   4. C G හා L   5. D I හා N   (.........)

26. ප්‍රසිද්ධ මිනර්වා නාට්‍යයක් වේ.
    1. B H හා F   2. K M හා O   3. D F හා M   4. F J හා K   5. C G හා L   (.........)

27. ප්‍රසිද්ධ ටීටර් නාට්‍ය වේ.

1. A B හා C 2. D E හා F 3. K L හා M 4. A J හා K 5. G H හා J (.........)

28. ලංකා විශ්වවිද්‍යාලය සිංහල ශාස්ත්‍රීය සමිතිය විසින් කරන ලද නාට්‍යයන් වේ.

1. E H හා J 2. E I හා N 3. D I හා N 4. F G හා I 5. I K හා M (.........)

29. ජයලත් මානෝරත්නයන්ගේ නාට්‍යයන් වේ.

1. A C හා E 2. F H හා J 3. I K හා M 4. C E හා G 5. C G හා L (.........)

30. සඳ සේ සියුමැලි වූ ඔබ සොම්බර මුහුණේ / නිල්වන් දෙනෙතින් උතුරා - ගැලූ උණුසුම් සෙනෙහස දහරා කුවේණි නාට්‍යයේ එන ඉහත ගීතය ගයන්නේ,

1. ජීවහත්ත 2. කුවේණි 3. ගායක පිරිස 4. දිසාලා 5. විජය (.........)

- **පහත තොරතුරු අංක 31 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට අදාළ කරගන්න.**

| | | |
|---|---|---|
| A - පුෂිකදෙන් | B - නරුකම් | C - කමකුරා |
| D - හනමිචි | E - ෂිතෙ | F - නරා |
| G - වකි | H - ෂිබරකු | I - සෙඅමි මොතොකියෝ |
| J - මාවරි බූතයි | k - සෙරිඅගෙ | L - කන්ජින්චෝ |
| M - මුරොමචි | N - කොකතා | O - ක්වන්අමි කියොත් සුගා |

31. නෝ නාට්‍ය නිර්මාතෘවරුන් සහ එම නාට්‍ය කලාවේ සිද්ධාන්ත ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

1. A C හා E 2. A I හා O D I හා N 4. F G හා I 5. I K හා M (.........)

32. විචාරකයන් විසින් බෙදන නෝ නාට්‍ය කලාවේ විකාශන යුගයන් වන්නේ,

1. C F හා M 2. A F හා K 3. D I හා N 4. B G හා L 5. C H හා M (.........)

33. නෝ නළුවන් වර්ග කිරීම් වලට අයත් වන්නේ,

1. E H හා L 2. C G හා K 3. D I හා N 4. E G හා N 5. B H හා J (.........)

34. කබුකි රඟහලේ කොටස් වන්නේ,

1. B G හා L 2. G H හා I 3. I M හා O 4. D E හා F 5. D J හා K (.........)

35. කබුකි නාට්‍ය අතර ජනප්‍රිය නාට්‍යයක් වන්නේ,

1. B G හා L 2. C F හා I 3. B H හා L 4. D I හා N 5. A J හා O (.........)

36. 1956 සරත්චන්ද්‍රන්ගේ මනමේ සේම 1964 දී බිහිවූ ප්‍රථම ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණය වන 'රාවනේසන්' නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

1. එස්. මෞනගුරු 2. කේ. කනපතිපිල්ලේ 3. චෞර්ණලිංගම්
4. එම්. ශන්මුගලිංගම් 5. එස්. විද්‍යානන්දන් (.........)

37. ඉංග්‍රීසි නාට්‍ය කලාව ලංකාවට හඳුන්වාදීමේ ලංකා විශ්ව විද්‍යාල නාට්‍ය සංගමයේ පුරෝගාමියා වන්නේ,

1. ඊ.එෆ්.සී. ලුඩොවයික් 2. එදිරිවීර සරත්චන්ද්‍ර 3. ජෙරමිද සිල්වා
4. නියුමාන් ජුබාල් 5. ඇෂ්ලිහල්පේ (.........)

38. ස්ථායි භාවයන් වලට අදාල නොවන්නේ,

1. ජුගුප්සා 2. අශ්‍රු 3. විශ්මය 4. රති 5. ශෝක (.........)

39. 'සවිසිරිත් වොරුදි බරණැස් පුරයේ' ගීතයේ තනුව නිර්මාණය වී ඇත්තේ 'දූල් නිමල් සිසි සේ දිසි සරදඹරේ' යන කුමන නාඩගම් ගීයට අනුවද,

1. සිංහවල්ලි 2. බුම්පෝඩ් 3. ඉයුජින්
4. හෙලේනා 5. බැලසන්ත (.........)

40. කෝලම් හා බෙහෙවින් සමානකම් දැක්වෙන ශාන්ති කර්මය ලෙස මහාචාර්ය සරත්චන්ද්‍රයන් පවසන්නේ,

1. සූනියම 2. දෙවොල් මඩුව 3. පහන්මඩුව
4. සන්නියකුම 5. කොහොඹා කංකාරිය (.........)

# නාට්‍ය හා රංගකලාව

13 ශ්‍රේණිය - I පත්‍රය

**II කොටස**

---

◈ **A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## A - කොටස

01. i. අර්ථෝපක්ෂේප 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. සංස්කෘත නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ මතවාද 05 ක් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

iii. කාලිදාසයන් සකුන්තලෝපාඛ්‍යානයෙන් කතා වස්තුව ගෙන සකුන්තලය නාට්‍ය නිර්මාණය කර ඇති ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08 යි)

02. i කුවේණි නාට්‍ය සඳහා තොරතුරු ලබාගත් ඓතිහාසික කෘති 02 සඳහන් කරන්න. (ලකුණු 04යි)

ii. කුවේණි නාට්‍යයේ නාට්‍යෝචිත අවස්ථා 05 ක් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

iii. කුවේණි නාට්‍යයේ නාට්‍ය දෘෂ්ටිය වන්නේ කුවේණිය යනු මොලොව සදාතන ගැහැණියයි. ඔබේ අදහස නාට්‍යයෙන් උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 06 යි)

03. i. නෝ නාට්‍ය කළාවේ විකාශය යුග පහකට බෙදා ඇත. එම යුග පහ නම් කරන්න. (ලකුණු 04 යි)

ii. නෝ නාට්‍යයේ හෝ කබුකි නාට්‍යයේ රංග ශෛලිය විස්තර කරන්න. (ලකුණු 05 යි)

iii. නෝ නාට්‍යයේ හෝ කබුකි නාට්‍යයේ වේදිකාවේ දළ සටහනක් ඇඳ නම් කරන්න. (ලකුණු 06 යි)

## B- කොටස

04. i. නාට්‍යකලාවේ මූලිකාංග 04 නම් කරන්න. (ලකුණු 04 යි)

ii. අංගරචනය යන්න හඳුන්වා එහි ප්‍රභේද වල භාවිතය විස්තර කරන්න. (ලකුණු 05 යි)

iii. සාත්වික භාවයන් නම්කර උදාහරණ සහිතව හඳුන්වන්න. (ලකුණු 06 යි)

05. i. පූජා කර්ම 03 සහ ශාන්තිකර්ම 03 නම් කරන්න. (ලකුණු 04 යි)

ii. පහතරට ශාන්තිකර්මයක ඇති නාට්‍යමය අන්තර් රංගයක නාට්‍යමය අංකුර අවස්ථා භාවිතය විස්තර කරන්න. (ලකුණු 05 යි)

iii. නාඩගම් ප්‍රභවය පිළිබඳ මත දෙකක් සඳහන් කර නාඩගම් රංග ශෛලියේ ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි)

06. i. 60 - 70 දශකවල සුවිශේෂිත නාට්‍ය නිර්මාණකරුවන් 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. ඔබ සඳහන් කළ නාට්‍ය නිර්මාණකරුවන් දෙදෙනෙකු කරන ලද නිර්මාණ නම් කර අගයන්න. (ලකුණු 05 යි)

iii. වර්තමාන නාට්‍ය කලාවේ දියුණුව සඳහා බලපෑ විවිධ හේතුන් පිළිබඳව ඔබ දන්නා නාට්‍ය ආශ්‍රයෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

57 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................ නාට්‍ය හා රංගකලාව II කාලය පැය තුනයි

උපදෙස්

♦ I කොටස II කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

♦ II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- **පළමු කොටසේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. පහත ප්‍රකාශයන් අතරින් ප්‍රාසංගික කලාවට අදාළ ප්‍රකාශ ඇතුළත් වරණය වන්නේ,

A ශිල්පීය පෞරුෂය මැනවින් හසුරුවයි.

B ගායනය රංගනය හා චලනය මත පදනම් ව ඇත.

C දෘෂ්‍ය ඉදිරිපත් කිරීමක් පමණි.

D ප්‍රේක්ෂක සහභාගීත්වය අත්‍යාවශ්‍ය නොවේ.

E ශ්‍රව්‍ය දෘෂ්‍ය සජීවී ඉදිරිපත් කිරීමකි.

1. A C හා D ය. 2. B D හා E ය. 3. A B හා E ය. 4. B C හා D ය. 5. C D හා E ය. (.........)

02. ' ලලිත කලා' ලෙස අදහස් කරනු ලබන්නේ,
1. රස වින්දනය සීමිත වූවකි.
2. භාව ප්‍රකෝප කරන්නකි.
3. රස වින්දනය සීමා කරමින් ආනන්දය ලබාදෙන්නකි.
4. බුද්ධියට ආමන්ත්‍රණය කරන ශිල්පීය වශයෙන් පරිපූර්ණ ජීවිත පරිඥානය පුළුල් කරන්නකි.
5. උප විඥානයේ තැන්පත්ව සිතුවිලි මතුකෙරෙන කලාවකි. (.........)

03. ඇරිස්ටෝටල් නාට්‍යයේ වැදගත්ම අංගය ලෙස සලකන්නේ,
1. චරිතය 2. චින්තනය 3. ප්‍රේක්ෂාව
4. සංගීතය 5. කතා වස්තුව (.........)

04. රූපණය හා සම්බන්ධ වන්නේ,
1. ඇන්ටන් චෙකෝව් 2. කොන්ස්තන්තීන් ස්ටැනිස්ලාවුස්කි
3. ඉයුරින් අයනෙස්කෝ 4. හෙන්රික් ඉබ්සන් 5. අන්ද්‍රෙ අන්තොයින් (.........)

05. වේදිකාව තුළ ආලෝකය භාවිතා කිරීමේදී ප්‍රේක්ෂකයා තුළ විශ්මය ජනක හා අද්භූත බව ගෙන දෙන පහන් වර්ගය වන්නේ,
1. අල්ට්‍රාවයලට් පහන් 2. යොමු පහන 3. වර්ණ චක්‍රය
4. හැලජන් පහන 5. සෙවනැලි නිර්මිත පහන් (.........)

06. ලෝකයේ පැරණිම නාට්‍ය සාහිත්‍ය අයත් වන්නේ,

1. ඉන්දියාවටයි. 2. ග්‍රීසියටයි. 3. යුරෝපයටයි.
4. ජපානයටයි. 5. රෝමයටයි. (.........)

07. ග්‍රීක නාට්‍යයේ කතාසීස් යනුවෙන් හඳුන්වන්නේ,

1. දුක නිසා ඇතිවන තත්වයකි. 2. භය හා කාරුණ්‍ය මත හටගන්නා තත්වයකි.
3. මානසික ආතතිය ස්වභාවයයි. 4. නළුවන් අනිවාර්යෙන් විඳිය යුතු සතුටකි.
5. ට්‍රැජඩි නැරඹීමට ඇති බියජනක ස්වරූපයයි. (.........)

- **පහත තොරතුරු ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - බර්ටෝල් බ්‍රෙෂ්ට් E - එමිල්සෝලා I - හැරල්ඩ් පින්ටර්
B - හෙන්රි බෙක් F - ඇල්බෙයා කැමු J - අන්ද්‍රෙඅන්තොයින්
C - ජෝන්ලයිලි G - අර්වින් පිස්කැටර් K - කිස්ටෝපර් මාලෝ
D - සැමුවෙල් බෙකට් H - රොබට් ග්‍රීන්

08. එලිසබතීන යුගයේ නාට්‍යකරුවන් වන්නේ,

1. A B හා C ය. 2. H I හා K ය. 3. D E හා H ය.
4. C H හා K ය. 5. I K හා L ය. (.........)

09. ස්වාභාවික රංගරීතියේ නාට්‍යකරුවන් වන්නේ,

1. D E හා J ය. 2. B E හා J ය. 3. G J හා K ය.
4. K J හා I ය. 5. D I හා J ය. (.........)

10. අසම්මත / අභූතරූපී / විකාරරූපී රංගරීතියේ නාට්‍යකරුවන් වන්නේ,

1. E G හා K ය. 2. H I හා K ය. 3. B C හා K ය.
4. E H හා M ය. 5. DF හා I ය. (.........)

11. අංඛ්‍යාත රංගරීතිය සම්බන්ධ නාට්‍යකරුවන් වන්නේ,

1. D හා E ය. 2. H හා J ය. 3. C හා F ය.
4. A හා G ය. 5. A හා K ය. (.........)

12. මුල්ම මධ්‍යකාලීන ජනවන්දනා නාට්‍ය ලෙස සැලකෙන්නේ,

1. පළමු එඬේරාගේ කතාව 2. මරියවරුන් තිදෙනාගේ කතාව 3. ආදම්ගේ කතාව
4. දෙවන එඬේරාගේ කතාව 5. දූවේ රජ තුන්කට්ටුව (.........)

- **පහත තොරතුරු ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - වේදිකා මණ්ඩප E - කොකේන් I - මාවරි භූතයි M - පැරඩෝස්
B - ස්කීන F - චතුරස්‍ර J - සංදර්ශනරථ N - ශිතෙ
C - විකෘෂ්ඨ G - කොකතා K - ප්ලැටියා O - ත්‍රසය
D - හනමිචි H - ඔකෙස්ට්‍රා L - සෙරිදෙසි

13. ජනවන්දනා නාට්‍ය රග දක්වන ලද්දේ,

1. C E හා J ය. 2. B H හා N ය. 3. A J හා K ය.
4. A F හා M ය. 5. D F හා N ය. (.........)

14. ග්‍රීක නාට්‍ය රංග භූමියේ අංගයන් වන්නේ,

1. B H හා M ය. 2. A C හා K ය. 3. D F හා N ය.
4. A F හා M ය. 5. A F හා M ය. (.........)

- **නිවැරදි පිළිතුරු තෝරන්න.**

15. ඔතෙලො නාට්‍යයේ තේමාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. විශ්වාසය මත පදනම් වූවකි. 2. මිත්‍රත්වය පිළිබඳ කතගාටුවකි.
3. මිනිස් සිතේ දරුණු ස්වභාවයයි. 4. ප්‍රේමය, අවිශ්වාසය හා කලකිරීම අතර දෝලනයක්.
5. සැබෑ ප්‍රේමය පූජනීය බව (.........)

16. අහස් තිරය (ගගනිකාව) යොදා ගනු ලබන්නේ,
1. දර්ශන මාරුකිරීම, වේදිකාවේ ගැඹුර මවා පෑමට 2. පසුතල දර්ශන මැවීම, නළුනිළියන් ආවරණය කිරීම.
3. වාදක මණ්ඩලය සිටීම, පහන් සඟවා තැබීම. 4. දර්ශන මාරු කිරීම, ගායක කණ්ඩායම සැගවීම.
5. පසුතල දර්ශන මැවීම, විචිත්‍ර ප්‍රේක්ෂාව මැවීම. (.........)

17. නියුමාන් ජුබාල් නාට්‍යකරුවා සම්බන්ධ වන්නේ,
1. පාස්කු නාට්‍ය කලාව 2. අසම්මත නාට්‍යකලාව 3. සදුපදේශ නාට්‍යකලාව
4. නූතන නාට්‍ය කලාව 5. ලංකා විශ්වවිද්‍යාලීය නාට්‍ය කලාව (.........)

18. ලංකාවේ ඉංග්‍රීසි නාට්‍යකලාවට මුල් කාලීන පුරෝගාමී වූ නාට්‍යකරුවා ?
1. ආතර් මිලර් මහතා 2. නියුමාන් ජුබල් මහතා 3. බර්ටොල් බ්‍රෙෂ්ට් මහතා
4. ලුඩොවයික් මහතා 5. ඉයුජින් අයනෙස්කො (.........)

19. කුකුලොපස් යනුවෙන් හඳුන්වන්නේ,
1. ග්‍රීක ට්‍රැජඩියකි 2. ජපන් කොමඩියකි 3. ග්‍රීක සැටර් නාට්‍යකි.
4. රෝම ප්‍රහසනයකි. 5. ග්‍රීක සුඛාන්තයකි. (.........)

20. ශේක්පියර් ශෝකාන්ත නාට්‍ය කෙරෙහි බලපාන ලද්දේ,
1. ප්ලේටෝගේ දර්ශනයන් ය. 2. ග්‍රීක ට්‍රැජඩි නාට්‍යයන් ය. 3. සෙනෙකාගේ නාට්‍යයන් ය.
4. සොක්‍රටීස්ගේ නාට්‍යයන් ය. 5. මිනැන්ඩර්ගේ නාට්‍යයන් ය. (.........)

21. පුරා කතා මත පදනම් වූ නාට්‍ය වන්නේ,
1. ඊඩිපස් රජ, ට්‍රොජන් ගැහැණු, ප්‍රොමිතියස් බන්ධනය 2. මීඩියා, බෙයිපොරකොයි, අයියස්
3. ඊඩිපස් රජ අල්කිස්ටිස්, මීඩියා 4. ඇල්කිස්ටිස්, පරාසිකයෝ, වළාකුළු
5. කුරුල්ලෝ, ඊඩිපස් රජ, පරාසිකයෝ (.........)

- **පහත තොරතුරු ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සයන්න.**

A - ඊවර් E - පොම්පේ J - එටියොක්ලේස් N - කලුකුරුසිය
B - තරන්තලා නැටුව F - පුරුෂාධිපත්‍යය K - ඉස්මෙන් I - බොබි
C - පොලිනීස් G - පිලිප්පි L - මාන්නාධිකම O - කැපිටෝලය
D - ආත්මාර්තය H - ගිනිඋදුන M - එමී

22. ජුලියස් සීසර් නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
1. A D හා E ය. 2. G I හා N ය 3. I K හා O ය. 4. E G හා O ය. 5. J N හා O ය. (.........)

23. සංකේත භාවිතය සඳහා අදාල වන්නේ,
1. A C හා F ය. 2. D I හා K ය. 3. A F හා K ය. 4. C G හා L ය. 5. B H හා N ය. (.........)

24. හෙල්මගේ චරිත ලක්ෂණ සඳහා අදාල වන්නේ,
1. D F හා L ය. 2. H M හා N ය. 3. A K හා K ය. 4. A C හා D ය. 5. C G හා L ය. (.........)

25. ඊඩිපස්ගේ දරුවන් වන්නේ,
1. A B හා F ය. 2. C J හා K ය. 3. K L හා M ය. 4. D E හා G ය. 5. D I හා L ය. (.........)

26. නොවුරා ගේ දරුවන් වන්නේ,
1. D E හා G ය. 2. A J හා K ය. 3. A I හා M ය. 4. C J හා N ය. 5. C H හා L ය. (.........)

- **ප්‍රශ්න අංක 27 සිට 30 දක්වා ප්‍රශ්න නොගැලපෙන පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න.**

27. 1. ජුලියස් සීසර් 2. හැම්ලට් 3. රොමියෝ ජුලියට් 4. රිචඩ් තර්ඩ් 5. ඔතොලෝ (.........)

28. 1. උපරි වේදිකාව 2. ස්වර්ගය 3. අභ්‍යන්තර වේදිකාව 4. ඒප්‍රනය 5. බූත් වේදිකාව (.........)

29. 1. වැනිසිය 2. ග්‍රීසිය 3. සයිප්‍රසය 4. ප්‍රංශය 5. රෝමය (.........)

30. 1. උන්නතිකාමය 2. බලය පිළිබඳ සදාතන ගැටුම 3. කුමන්ත්‍රණකරුවෝ
4. සමුහාණ්ඩු වට එරෙහි රාජාණ්ඩුව 5. පළියට පළිය (.........)

31. මධ්‍යකාලීන සදුපදේශ නාට්‍ය සඳහා අයත් වන්නේ,
1. රෙදි අපුල්ලන්නෝ 2. කෝපස් ක්‍රිස්ටි 3. මැන් කයින්ඩ්
4. ඇඳුම් මසන්නෝ 5. අවසන් භෝජන සංග්‍රහය (.........)

32. 'වාචලයො ස්තුති කරගනින් තමන්ටම, මං කියපු විදියට එදාම මුගේ දිව කපා දැමීම නම් අද මෙහෙම අහන්න වෙන්නෙ නැනෙ.
ජුලියස් සීසර් නාට්‍යයේ එන ඉහත සංවාදය කවරකු විසින් කියන ලද්දක් ද?
1. බෲටස් 2. ඔක්ටේවියස් 3. ඇන්ටනි 4. සීසර් 5. කැෂියස් (.........)

33. 'අමුත්තෙකුගෙ කාමරේ රැයක් ගත කරන්න.' මෙය පවසන ලද්දේ,
1. ජුලියස් සීසර් නාට්‍යයේ ඇන්ටනි ය. 2. ඩෝල්ස් හවුස් නාට්‍යයේ නොවිරා ය.
3. ජුලියස් සීසර් නාට්‍යයේ පෝෂියාය. 4. ඊඩිපස් නාට්‍යයේ ජොකස්ටාය.
5. ඩෝල්ස් හවුස් නාට්‍යයේ රන් (.........)

34. විවිධ වර්ණ මගින් විවිධ අර්ථ චර්යා, ලක්ෂණ හෝ මනෝ භාව සංකේතවත් කෙරේ. එහිදී රතු වර්ණයෙන් සංකේතවත් කරන්නේ
1. විනාශය හා සරාගී බව 2. තරුණ්‍ය හා සතුට 3. රාජකීය බව හා උදාර බව
4. ශෝකය හා දිළිඳු බව 5. පිවිතුරු බව හා හුදෙකලාව (.........)

35. පශ්චාත් දෘෂ්ටී කථන ස්වරූපය දක්නට ලැබෙන්නේ,
1. අභූතරූපී නාට්‍ය 2. විකාරරූපී නාට්‍ය 3. ග්‍රීක නාට්‍ය
4. එලිසබතීන නාට්‍ය 5. ප්‍රකාශනවාදී නාට්‍ය (.........)

36. නාට්‍ය ජීවිතයේ පිටපතක් බවත් සිරිත් විරිත් වල කැඩපතක් බවත් ප්‍රකාශ කරන ලද්දේ,
1. ඇලඩයිස් නිකොල් 2. ඇරිස්ටෝටල් 3. බර්නාඩ් ෂෝ 4. භරතමුනි 5. අභිනව ගුප්ත (.........)

37. නාට්‍ය සංගීතයේ ලක්ෂණයක් නොවන්නේ,
1. වචනාර්ථයට ඔබ්බෙන් පවතින ගැඹුරු මනෝභාවයන්ට ආමන්ත්‍රණය කළ හැකි විම.
2. සංගීතඥයාගේ ශාස්ත්‍රීය දැනුම සම්භාරය අන්තර්ගත කොට නිර්මාණය කිරීම.
3. ඖචිත්‍යයෙන් යුතු වීම හා නළුවාගේ භාව ප්‍රකාශනයට යොදා ගැනීම.
4. ආදෙශ භාණ්ඩවලින් ද විවිධ ශබ්ද හා හඬ අවස්ථානෝචිතව යොදා ගැනීම.
5. දෘෂ්‍ය කාව්‍යමයකු ගුණය තීව්‍ර කිරීමට දායක වීම. (.........)

38. නාට්‍යයට සම්බන්ධ සියළුම දෙනා මෙයෙහවමින් නාට්‍ය දර්ශනය ආරම්භ කිරීමත් පවත්වාගෙන යාමත් සිදු කරනු ලබන්නේ,
1. නිෂ්පාදක 2. අධ්‍යක්ෂ 3. පෙළ කියවන්නා 4. රචකයා 5. වේදිකා පරිපාලක (.........)

39. නොගැලපෙන පිළිතුර තෝරන්න.
1. සංස්කෘත නාට්‍යයේ අධ්‍යක්ෂවරයා සූත්‍රධර ය.
2. අධ්‍යක්ෂ, නිෂ්පාදක, පෙළ රචක, එක් පුද්ගලයෙක් විය හැකිය.
3. නාට්‍ය පිටපත තම අභිමතය මත පමණක් අර්ථකථනය කිරීමට අධ්‍යක්ෂවරයාට අයිතියක් නැත.
4. නාට්‍ය නිෂ්පාදනයේ මූලික වගකීම අධ්‍යක්ෂවරයා දරයි.
5. නාට්‍ය නිෂ්පාදනයේදී විවිධ ශිල්පීන් සමඟ සහයෝගයෙක් කටයුතු කළ යුතුයි. (.........)

40. ක්ෂණික නිරූපණයක් සාර්ථක වීමට අදාල නොවන ප්‍රකාශය වන්නේ,
1. කලින් සකස් කරගත් පිටපතක් මත රංගනය ගොඩ නගා ගැනීම
2. ක්ෂණිකව මාතෘකාවක් තෝරා ගැනීම.
3. ලැබී ඇති කාලය හා අවකාශය උචිත ලෙස භාවිතා කිරීම.
4. කෙටි කාල පරාසයක් තුළ ගොඩනගා ගත හැකි වීම.
5. අනුකරණය හා නිරූපණය පිළිබඳ අවබෝධයෙන් යුක්ත වීම. (.........)

**දෙවන වාර පරීක්ෂණය - 2020**

**නාට්‍ය හා රංගකලාව**

13 ශ්‍රේණිය - **II** පත්‍රය

**II කොටස**

---

**◈A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## <u>A - දේශීය නාට්‍ය කලාව</u>

01. i. ග්‍රීක නාට්‍ය ආරම්භය හා විකාශය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 04 යි)
    ii. ඊඩිපස් නාට්‍ය තුළින් නාට්‍යකරුවා මතු කිරීමට උත්සහ දරන සත්‍ය කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
    iii. ග්‍රීක නාට්‍ය තුළ අත්වැල සුවිශේෂී මෙහෙයක් ඉටු කරයි. උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

02. i. ජුලියස් සීසර් නාට්‍යයේ කැෂියස් පවසන පරිදි බෲටස් ට වරදින අවස්ථා තුනකි. එම අවස්ථා තුන කුමක්ද? (ලකුණු 04 යි)
    ii. එම නාට්‍යයේ මාක් ඇන්ටනිගේ අවමංගල දේශනයෙන් පසුව කුමන්ත්‍රණකරුවන්ට මුහුණ දීමට සිදුවන සිදුවීම් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. මෙම නාට්‍යයේ සීසර්, බෲටස්, කැසියස්, ඇන්ටනී යන චරිත අතරින් දෙකක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 06 යි)

03. i. රූකඩ ගෙදර නාට්‍යයේ සංකේත අතර විශේෂිත සංකේතය කුමක්ද? (ලකුණු 02 යි)
    ii. රූකඩ ගෙදර නාට්‍ය සඳහා ඉබ්සන් භාවිතා කළ රංග රීතිය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. මෙම නාට්‍ය සඳහා පශ්චාත් දෘෂ්ඨී කථන රීතිය යොදගෙන ඇත. එම රිතිය ප්‍රේක්ෂකයාට අවබෝධ වන්නේ කුමන අවස්ථා වෙන් පසුවදැයි සඳහන් කර නාට්‍යයේ උච්චතම අවස්ථා ව දක්වා නෝරාගේ ක්‍රියාකලාපය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

## B - කොටස

04. i. කලාවේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. ප්‍රාසාංගික කලාව හඳුන්වා එම කලා අංග 04 ක් නම් කරන්න. (ලකුණු 05 යි)
    iii. ඔබ නම් කරන ලද එක් ප්‍රාසාංගික කලා අංගයක් නාට්‍ය කලාව හා සංසන්දනය කරන්න. (ලකුණු 06 යි)

05 i. රූපණය යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 04 යි)
    ii. රූපණ ශිල්පියා තම කුසලතා ප්‍රගුණ කිරීමේදී සැලකිලි මත්විය යුතු කරුණු පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. රූපණය පිළිබඳ මතවාද ඉදිරිපත් කළ බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් හා ස්ටැනිස් ලාවුස්කිගේ ක්‍රම වේදයන් පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

06. i. ප්‍රොසීනියම් වේදිකාව බෙදුන කොටස් සංඛ්‍යා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
    ii. එසේ බෙදීම නිසා, නළුවාට, සහ අනෙකුත් ශිල්පීන්ට ලැබෙන ප්‍රයෝජන සඳහන් කරන්න. (ලකුණු 05 යි)
    iii. ප්‍රොසීනියම් වේදිකාවේ වේදිකා පරිපාලකගේ කාර්ය භාරය කෙසේ විය යුතු ද ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 06 යි)

# නාට්‍ය හා රංගකලාව 2020 - දෙවන වාර පරීක්ෂණය

## 13 ශ්‍රේණිය - I පත්‍රය

<u>**1 කොටස - පිළිතුරු**</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 5 | 21. | 4 | 31. | 2 |
| 2. | 2 | 12. | 3 | 22. | 3 | 32. | 1 |
| 3. | 1 | 13. | 1 | 23. | 2 | 33. | 4 |
| 4. | 5 | 14. | 2 | 24. | 5 | 34. | 5 |
| 5. | 3 | 15. | 4 | 25. | 2 | 35. | 3 |
| 6. | 2 | 16. | 5 | 26. | 1 | 36. | 5 |
| 7. | 2 | 17. | 2 | 27. | 4 | 37. | 1 |
| 8. | 4 | 18. | 1 | 28. | 2 | 38. | 2 |
| 9. | 1 | 19. | 3 | 29. | 5 | 39. | 3 |
| 10. | 3 | 20. | 4 | 30. | 1 | 40. | 4 |

**1 පත්‍රය - 11 කොටස.**

### A– කොටස

01. i. ප්‍රවේශක, විෂ්කම්භක, අංකමුඛ, අංකවතාර, චූලිකා (ල. 04)

ii. රූකඩ නැටුම් ආශ්‍රයෙන් බිහිවීම.
සූත්‍රධාර රූකඩ නටවන්නා යන අරුතින් යොදාගත් බව සහ රූකඩ නාට්‍යයේ එන විදූෂක චරිතය සංස්කෘත නාට්‍යයට ගෙන ඇති බව කියැවේ.
වීර කාව්‍ය ඇසුරින් බිහිවීම.
මහා භාරතය භගවත් ගීතාව ආදි
සංස්කෘත නාට්‍යයට ආගමික ප්‍රභවයක් ඇතැයි විශ්වාස කොට අශ්වමේධ මහා ව්‍රත ආදි යාග විධීන්හි භාවිතා වූ විනෝදාත්මක හා උපහාසාත්මක සංවාද කතා ආදිය නාටයේ විකාශය කෙරෙහි බලපා ඇති බවට ද මතයක් ඇත.
නාට්‍ය ශාස්ත්‍රයට අනුව දිව්‍ය ලෝකයේ නිෂ්පාදනය කරන ලද ප්‍රථම සමවකාර නම් ප්‍රභේදයට අයත් අමෘත මන්ථනය.
රූකඩ නාට්‍යයක් වූ 'ඡායා නාටක' සංස්කෘත නාටකයේ ප්‍රභවය හේතුවිය.
ඉන්දියාවේ සංචාරක නාට්‍ය කණ්ඩායම් සිටි බව සංයුක්ත නිකායේ සඳහන් විය.
නගරයේ පවති සරස්වති භවනෙහි පොහෝ දිනවල දෙවියන් උදෙසා නාට්‍ය සංදර්ශන පැවැත්වූ බව කාම සූත්‍රය සඳහන් කරයි.
නළු වාතිය සුරක්ෂිත කිරිමට රජය කැප වූ බව කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය සාක්ෂි කරයි.

iii. සකුන්තලෝපාඛ්‍යානයේ සකුන්තලා ළාමක ගති ලක්ෂණ නොතිබුණ කාන්තාවකි. ඇය රජු හා ආලයෙන් වෙලි රජු හා ගාන්ධර්ව විවාහයෙන් විවාහ වීමට පෙර රජුගෙන් වරයක් ඉල්ලා සිටි. එනම් එසේ විවාහ වීමෙන් පසුව දරුවෙක් ලැබුණහොත් එම දරුවාට යුවරජකම ලබා දෙන ලෙස ඉල්ලා සිටි. නමුත් සකුන්තලා නාට්‍යයේ සකුන්තලා එසේ නොවේ අව්‍යාජ ආදාරය මත පමණක් පිහිටා රජු හා ගාන්ධර්ව විවාහයෙන් විවාහ විය.
සකුන්තලාගේ පාඛ්‍යානයේ සකුන්තලාට දරුවා ලැබී අවුරුදු හයකින් රජු මුණ ගැසීමට යාම.
එහෙත් සකුන්තලා නාට්‍යයේ සකුන්තලා දරුවා ලැබීමට පෙර රජු මුණ ගැසීමට යාම.
සකුන්තලෝපඛ්‍යානයේ සකුන්තලා සැර පරුෂ ගති ඇති සුකොමල ගති ලක්ෂණ අවම වූ සුන්දර කාන්තාවකි.
එහෙත් සකුන්තලා නාටයේ සකුන්තලා ඉතා සුකොමල ගති ලක්ෂතා ඇති කරුණාවන්ත, ආදරණීය, අව්‍යාජ සුන්දර ලලනාවකි.
සකුන්තලෝපාඛනයේ මුදුව අතුරුදහන්වීම පිළිබඳව නොකිය වේ. රජුට අමතක බව පැවසීමක් සමඟ අහස ගිගිරුම් දෙන හඬකින් බියවන රජු සාකුන්තලාව භාරගනි.
එහෙත් සකුන්තලා නාට්‍යයේ රජු ඇයව බාර නොගන්නා අතර පසුව මතක්වීම් නිසා නැවත ඇයව සොයාගොස් දරුවා හා ඇයව භාරගෙනි.
ආදි ලෙස කරුණු 04 ක් වත් ලියා ඇත්නම් ලකුණු 08 ක් දෙන්න.

02. i. මහාවංශය, දීපවංශය, කුවේණි අස්න, රාජාවලිය, සිහබා අස්න

ii. කුවේණිය කපු කැටීමේ නිරත වන අවස්ථාව | විජය කුවේණි මුණ ගැසීම
කුවේණිය හා විජය අතර මතුවන ගැටුම | කුවේණිය දරුවන් හ ඉමාලිගයෙන් නික්මීම.
නෑදැයන්ගෙන් අවමන්ලැබීම. | දරුවන් වනගත වීම.

iii. සඳා කාලෙම ලොව පහළ වූ
සඳා කාලෙම ලොව පහල වන
කුවේණියමයි එකම ගැහැණිය
එදා උපන්න් අද උපන්නත්
ආදී ලෙස උපුටා දැක්වීම් සහිතව කරුණු සාධාරණව ඔප්පු කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03. i. පූර්ව ඓතිහාසික යුගය, නරා යුගය, කමකුරා යුගය, මුරොමචි යුගය, එදෝ යුගය.

ii. රංග ශෛලියට අදාලව තොරතුරු සඳහන් කරයි නම් ලකුණු ලබාදෙන්න.

iii. නෝ වේදිකාව- කගමි නොම, අගෙමකු, බුතයි, හෂිගකරි ෆයින් ගස් තුන, ශිතෙ, වකි කණු, ෂිරසු ආදී අතශවශ්‍ය කොටස් 6 ක් නම් කරයිනම් ලකුණු ලබා දෙන්න.
කබුකි වේදිකාව - කකිවරි, මාවරි බූතයි, හනමිචි, සෙරි දෙසි ආදී අත්‍යාවශ්‍ය කොටස් නම් කරයිනම්.

## B - කොටස

04. i. නාට්‍ය පෙළ, සංගීතය, අංගරචනය, පසුතල නිර්මාණය, වෙස්මෝස්තර,

ii. අංග රචනය යනු චරිතයක ඇඳුම් වලින් නොවැසු බාහිර කොටස (මුහුණ හා ශරිරය) චරිතයට ගැලපෙන ආකාරය වර්ණ ගල්වා සකස් කිරීමයි.
සරල අංගරචනය, චරිතාංග අංග රචනය නම් කර එහි භාවිතය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න

iii. ස්ථම්භ - ශරීය දරදඩු වීම | රෝමාංච - රෝම සෘජුවීම | ස්වරංභංග - කටහඬ බිදම
වේපතු - සර්වාංගය වෙව්ලීම | අශ්‍රු - කඳුළු සැලීම | වෛර්ණ - ශාරීරික පැහැය වෙනස් වීම
ස්වේද - දහදිය දැමීම | ඵලය - සිහිමුර්ජවා
ලෙසින් දක්වා නාට්‍යයකින් එම අවස්ථාවන්ට උදාහරණ දක්වා ඇත්නම් පූර්ණ ලකුණු ලබා දෙන්න.

05. i පූජා කර්ම - දොරකඩ අස්න, ආලවක දමනය, පිරිත් පිංකම, සුවිසි විවරණ, යුගාසන බණ
ශාන්තිකර්ම - කොහොඹාකංකාරිය, දෙවොල් මඩුව, රට යකුම, සූනියම් යාගය, සන්නියකුම, පහන් මඩුව, කිරිමඩුව

ii. පහතරට නාට්‍යමය අන්තර් රංගයක අනුකරණ සමාරෝපණය සංවාද භාවිතය, වේදිකාව භාවිතය, ආලෝකය භාවිතය, අනුෂංගික අංග භාවිතය, ප්‍රේක්ෂකයා ආදි වූ අංකුරමය අවස්ථා දැකිය හැකි ආකාරය විස්තර කර ඇත්නම් අවස්ථා දැකි හැකි ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. තෙරික්කුත්තු වීදි නාට්‍ය ආභාෂය | දේශීය කවි නාටක ආභාසය
අලගනායිඩු ගෙන් පැවතෙන බව | ජනවන්දනා හා පාස්කු බලපෑ බව
පොතේ ගුරු හා ගායක පිරිසක් සිටීම.
පූර්ව රංගනයක් හා ස්ථාවර පාත්‍රයන් සිටීම. | නිශ්චිත රංග ආකෘතියක් තිබීම.
නාට්‍යධර්මි රංග ශෛලිය භාවිතය රාත්‍රි 3-4 පෙන්වීම.
කරලිය නම් ස්ථානයක පෙන්වීම.
කිට්සන් පහන් හෝ පන්දම් අලෝකය භාවිතය
කර්ණාටක සංගීතය යෙදීම.

06. i එදිරිවීර සරච්චන්ද්‍ර | ගුණසේන ගලප්පත්ති | හෙන්රි ජයසේන
දයානන්ද ගුණවර්ධන | සුගතපාලද සිල්වා | සයිමන් නවගත්තේගම | ආර්.ආර්. සමරකෝන්

ii. පිළිතුරේ සඳහන් නාට්‍යකරුවන්ගේ නිර්මාණ නම් කර කෙටියෙන් විස්තර කර ඇත්තේ ලකුණු ලබා දෙන්න.

iii. අසම්මත රංගය වේදිකාව හඳුන්වා දීම (හස්තිරාජ මහත්තයා, කවුරුවත් එන්නෙ නෑ)
කුරිරු රංගය හඳුන්වා දීම (මලවුන් නැගටීම)
තරුණ නාට්‍යකරුවන්ගේ නාට්‍යවල සම්ප්‍රාප්තිය (දෝර් දණ්ඩා, සෙවනැලි හා මිනිස්සු)
නාට්‍ය ශෛලින් පිළිබඳව පර්යේෂණාත්මක අත්හදා බැලීම (තලමල පිපිටා , ගුරුතරුව, අන්දරේලා)
අනුවර්තන නාට්‍ය ප්‍රචලිත වීම (තාරාවෝ ඉගිලෙති, රෝමය ගිනි ගනි)
කෙටි නාට්‍ය පිළිබඳ උනන්දුව
ඉතිහාසය ගත සංසිද්ධීන් හි යටිපෙළ යථාර්ථය ගවේෂණය කිරීම (දෝන කතරිනා, දෙවෙනි මහින්ද)
ප්‍රවීණයන් හා නවකයන් අතර තරගකාරි අත්හදා බැලීම්

# නාට්‍ය හා රංගකලාව

## 13 ශ්‍රේණිය - II පත්‍රය

**I කොටස - පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| 1. 3 | 11. 4 | 21. 1 | 31. 3 |
| 2. 4 | 12. 3 | 22. 4 | 32. 5 |
| 3. 5 | 13. 3 | 23. 5 | 33. 2 |
| 4. 2 | 14. 1 | 24. 1 | 34. 1 |
| 5. 1 | 15. 4 | 25. 2 | 35. 3 |
| 6. 5 | 16. 5 | 26. 3 | 36. 1 |
| 7. 2 | 17. 5 | 27. 4 | 37. 2 |
| 8. 4 | 18. 4 | 28. 5 | 38. 5 |
| 9. 2 | 19. 3 | 29. 2 | 39. 4 |
| 10. 5 | 20. 3 | 30. 3 | 40. 1 |

**II කොටස - පිළිතුරු**

**A - දේශීය නාට්‍ය කලාව.**

01. i. දියෝනීසස් දේව වන්දනය මූලික කරගෙන ආරම්භ වූ ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.
    ii. සියල්ල අභිනවා ඉරණමට අනුව සියල්ල සිදුවන බවත් දේව නියමය වැලක්විය නොහැකි බවත් උදාහරණ සහිතව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
    iii. අත්වැල නාට්‍ය තුළ විවිධ ආකාරයෙන් පෙනී සිටිමින් සජීවී ප්‍රේක්ෂාවක් ලබාදෙන ආකාරය උදාහරණ සහිතව විස්තර කර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

02. i. ඇන්ටනිව බෘටස් බල ඇණියට සම්බන්ධ කර ගැනීම.
    ඇන්ටනිව අවමගුල් දේශනය කිරීමට අවස්ථාව ලබාදීම.
    පිලිප්පිහි යුධ කටයුතු සංවිධානය කිරීම.
    ii. මහජනතාවට කෝපයට පත්වීම නිසා කුමන්ත්‍රණය මෙහෙය වූ නායකයන්ට රෝමයෙන් පිටව යාමට සිදුවීම.
    රෝමයේ ඉතිරි වූවන් ඝාතනයට ලක්වීම.
    බෘටස් හා කැසියස් අතර අමනාපකම් ඇතිවීම.
    සේනා නඩත්තු කිරිම.
    සීසර්ගේ අවතාරය දෘෂ්‍යමාන වීම
    මානසික ස්වභාවය දුර්වල වී සටහනින් පැරදීම
    තම තමන් විසින්ම දිවි තොර කර ගැනීම
    සැලසුමක් නැති වීම නිසා පරාජය වීම.
    iii. ලියා ඇති චරිතයන්ට අනුව තොරතුරු සටහන් වී ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03. i. නත්තල් ගස
    ii. යථාර්තවාදී රංගරීතිය පිළිබඳව විස්තර කරයි නම් ලකුණු ලබා දෙන්න.
    iii. ලින්ඩෙ මහත්මිය හා නොවුරා මුණ ගැසුන එක් අවස්ථාවක නුව්රා සියල්ල ලින්ඩෙ මහත්මිය හා පැවසීම මෙහි ආරම්භයයි. එම අවස්ථාවේ සිට නොව්රා ගෙදර හැරදා යන අවස්ථාව දක්වා විශේෂිත සිදුවීම් සියල්ල පෙළ ගස්වා ඇත්නම් සම්පූර්න ලකුණු ලබා දෙන්න.

**A - කොටස**

01. i. ගැමිකලා, ව්‍යවහාරික කලා, ලලිත කලා
    ii. ගායනය රංගනය චලනය පදනම් කරගෙන ශිල්පීය පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් ශ්‍රව්‍ය දෘශ්‍ය සජීවීව සෘජු ප්‍රේක්ෂක පිරිසක් ඉදිරිපිට වේදිකාවක් මත සජීවීව ඉදිරිපත් කරනු ලබන කලාව ප්‍රාසාංගික කලාව ලෙස හැඳින්වේ.
    iii. නම්කර ඇති එක් ප්‍රාසාංගික කලා අංගයක් නාට්‍ය කලාව හා වෙනස් වන ආකාරය උදාහරණ සහිතව විස්තර කරයි නම් ලකුණු ලබා දෙන්න.

02. i. කායික මානසික හැකියාවක් වර්ධනය

ii. **බ්‍රෙෂ්ට්**

මෙහිදී දුරස්ථීකරණ න්‍යාය අනුව ලකුණු ලබාදීම කළ යුතුය.
නළුවා චරිතයට ආවේශ නොවිය යුතුය.
නළුවාත් ඔහු නිරූපණය කරන චරිතයක් අතර පැහැදිලි පරතරයක් තිබිය යුතුය.
තමා නළුවකු යන හැඟීම සෑම විටම නළුවා මතකයේ තබා ගත යුතුය.
නළුවා යමක් සිදුවූ අයුරු කර පෙන්වන්නකු වේ.

**ලාවුස්කි.**

තද්විධි රූපණ ක්‍රමය (Method Acting)
චරිතයක බාහිර හා අභ්‍යන්තර ලක්ෂණ ගවේෂණය කිරීම.
චරිතයේ බාහිර හා අභ්‍යන්තර ස්වරූපයක් මෙනෙහි කිරීම.
පිටපත කියවා යුගයේ ඉතිහාසය, දේශපලානය සිතුම් පැතුම් ආදිය අධ්‍යයනය කිරීම.
නළුවා තම පෞද්ගලික අත්දැකීම් ඔස්සේ පරිකල්පනය මෙහෙයවා චරිත ගොඩනගා ගත යුතුවීම.
නළුවා සවිඥානිකව අවිඥානික වන බව
සිත හා කය ඒකාග්‍රකොට භූමිකාවක සත්‍ය ස්වරූපයක් නිර්මාණය කර ගැනීම.
චරිතය කේන්ද්‍රකොට නිර්මාණාත්මකව විහිදුවාලීම.
එක් අයක කරුණු 03 ක් වත් විය යුතුය.

03. i. කොටස් 9, 12,15

ii. රංග භූමියේ අවකාශය පිළිබඳ අවබෝධය ලැබීම.
රූපණය සඳහා පහසුවීම.
අධ්‍යක්ෂවරයාගේ කාර්ය පහසු වීම.
රංගාලෝක සැලසුම්
හඬ ප්‍රක්ශේපණය සඳහා
පසුතල සැලසුම් සඳහා

iii. ප්‍රොසිනයම් වේදිකාවේ වේදිකා පරිපාලකයේ වගකීම් පිළිබඳව සඳහන් කරයි තම ලකුණු ලබා දෙන්න.